

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **56 වන කාණ්ඩය** | **බු.ව. 2557 මැදින් මස පුරපසළොස්වකද<br>ක්‍රි.ව. 2014 මාර්තු මස 16 වන ද** | **11-12 වන කලබ** |

# මී මැස්සා මලට කළ තුතිය

ලොවේ සොඳුරු සොබා විසුළ
පැහැසර ගුණ කඳ සුනිමල
නො දිටිමි අන් කවරකු තුළ
ඔබ වෙයි මගෙ මිතුරු අතුල

පර වන බව ඔබ දනිතුදු
පසු බට නො ම වී මඳකුදු
ඔබ මෙහෙවර කරයි පුරුදු
ආවත් ගැරහුම් නෙක රුදු

රුසිරු සුමුදු ගුණය මහරු
සුවඳින් හැමට ම පියකරු
ඊටත් වැඩියෙන් විසිතුරු
ඔබ සම මෙත බෙදන අයුරු

**- අනඳ**



# බුදුසමයෙන් ආභාසය ලැබූ සිංහල ජාතිය

රුහුණු විශ්වවිද්‍යාලයේ කුලපති
අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය පල්ලත්තර සුමනජෝති
නාහිමිපාණන් විසිනි

ශ්‍රී ලංකා වාසීන්ගේ ඉතිහාසය ඈත අතීතය දක්වා දිවෙන්නකි. ලෝක ශිෂ්ටාචාරයේ ඉපැරණි ම කේන්ද්‍රස්ථානය ලෙස සැලකෙන මිසරය, ග්‍රීසිය, බැබිලෝනියාව, චීනය, ඉන්දියාව ආදී රටවල් අතරට මේ කුඩා ලංකාව ද අයත් වන බව ආඩම්බරයෙන් කිව හැකි ය. පුරාවිද්‍යාත්මක ගවේෂණයන් ගෙන් සොයාගෙන තිබෙන සාධක අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේ පවා මෙරට ශිෂ්ට සම්පන්න දියුණු ජාතියක් විසූ බව හෙළි කරගෙන තිබේ. ලෝකයේ අන් කවර ජාතියකටවත් කවර රටකටවත් නොමැති මුල පටන් අපේ ඉතිහාසය ලියවුණු ''මහා වංශය'' ''දීප වංශය'' යන ඓතිහාසික ග්‍රන්ථ මේ පිළිබඳව ඉදිරිපත් කරන විස්තර පුරාවිද්‍යාවෙන් සහ වෙනත් මූලාශ්‍රයවලින් ඔප්පු වී තිබීම ඉහත සඳහන් කාරණා තහවුරු කරයි. මේ භද්‍ර කල්පයේ පහළ වූ කකුසඳ, කෝණාගම, කාශ්‍යප යන බුදුවරුන් මෙරටට වැඩි බවත් ඒ බුදුවරුන් ගේ කාලවලදී මේ දිවයින ඕජදීප, වරදීප, මණ්ඩදීප යන නම්වලින් හැඳින්වූ බවත් මහාවංසය

සඳහන් කරයි. මිහිඳු මහ රහතන් වහන්සේ ගේ එළිදරව්වක් වන එය කිසිසේත් ම සත්‍යයෙන් තොරයයි බැහැර කළ නොහැකි ය. එය බැහැරලන්නේ නම් සෙසු බොහෝ දේ ද අපට බැහැර ලන්නට සිදුවේ.

පෙර අපර දිග විද්වතුන් විසින් මෙරට හඳුන්වා තිබෙන පරිදි රත්නදීප, සීහළදීප, සෙරෙන්ඩිබ්, ලංකාදීප, සිලෝන් ආදි විවිධ නම්වලින් හෙලිවන්නේ මේ රට නිදහස් නිවහල් ඒකීය රාජ්‍යයක් වශයෙන් අනාදිමත් කාලයක සිට පැවැති බවත් එසේම එය සිංහලයන් ගේ ජන්ම භූමිය වූ බවත් ය. සිවු හෙළයන් විසූ රට නිසා සිංහල වී යයි සමහරුන් සිතන අතර සිංහල නම් භාරතීය ජන කොටසකගේ ප්‍රමුඛත්වයෙන් ඒකරාශී වූ ජනතාවකගෙන් සමන්විත වූ නිසා සිංහල වී යයි සමහරු සිතති. කෙසේ හෝ මේ රටේ වර්තමාන ඉතිහාසයට අනුව අපේ ආදීම පුරුෂයන් සිංහලයන් වූ බව නිසැක ය. ලෝකයේ වෙනත් රටවල මෙන් මෙහි ද එදත් අදත් අන්‍ය ජාතිකයෝ, අන්‍ය රාෂ්ට්‍රියයෝ වෙසෙති. ඒ නිසා මෙය බහුජාතික රටක් නොවේ. මිහිඳු මහරහතන් වහන්සේ වැඩිය පසු මෙරට සිටි සියලු ම මනුෂ්‍යයන් බුදුදහම වැලඳ ගෙන බෞද්ධයෝ වූහ. ඒ අනුව මෙය බෞද්ධයන් ගේ රටකි. එහෙත් වෙන රටවල මෙන් අබෞද්ධයෝ වෙසෙති. ඒ නිසාම මෙරට බහු ආගමික රටක් නොවේ. සිංහලයන් එදා සිටම කරුණා මෛත්‍රී ගුණයෙන් යුත් අතිථි (ආගන්තුක) සංග්‍රහයෙහි නියැලුණු ජාතියක් වූ නිසා අන්‍ය කවර ජාතියක් වුවත් කවර අන්‍ය ආගමිකයන් වුවත් සාදරයෙන් පිළිගත්තා පමණක් නොව මෙහි නිදහසේ විසීමට ද පහසුකම් සලසා දුනි. එහෙත් අද කැබැල්ලෑවාගේ ගෙට රිංගාගත්

ඉත්තෑවා මෙන් ඇතැම් ජාතීහු සිංහලයන්ගේ ද සහාය ඇතිව සිංහලයන්ට වින කරති.

ගෞතම බුදුරජාණන් වහන්සේ පිරිනිවි වෙසක් පුර පෝ දිනෙහිවත් මෙයට වසර 2536 ට පෙර දඹදිවින් පැමිණි විජය නම් රාජකුමාරයාගෙන් ඇරඹුණ සිංහල රාජවංසය අවුරුදු දෙදහසකට අධික කාලයක් මේ සිංහල බෞද්ධ රට පාලනය කළේ බුදු සසුනත් සිංහල ජාතියත් රටත් තම අසහාය උරුමයත් වශයෙන් සලකා ගෙන ය. බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු දෙසියක් පමණ වනවිට භාරතයේ රාජ්‍ය බලය මෞර්යවංශික චන්ද්‍රගුප්ත අධිරාජයා විසින් අත්කර ගැනිණි. ඔහු පුත් බින්දුසාර අධිරාජයාගේ පුත් ධර්මාශෝක රජු බුදු දහම වැලඳගෙන එය දේශ දේශාන්තරවල ව්‍යාප්ත කිරීමට මොග්ගලීපුත්ත තිස්ස රහතන්වහන්සේ ප්‍රමුඛ මහා සංඝයාට ආධාර දුනි. බුද්ධ පරිනිර්වාණයෙන් දෙසියතිස් වන අවුරුද්දෙහි තෙවන ධර්ම සංගීතිය පැවැත්වූ මුන් වහන්සේ මධ්‍ය මණ්ඩලයෙන් බැහැර ඉන්දියාවේ හා ඉන්දියාවෙන් බාහිර රාජ්‍ය නවයකට භික්ෂු ධර්මදූත කණ්ඩායම් යැවූහ. ඒ අතරින් ලංකාවට එවූ අශෝක රජුගේ පුත්‍ර මිහිඳු මා හිමියන් හා රාජ වංශයට ම අයත් සුමන සාමණේරයන්, භණ්ඩුක උපාසකතුමා හා සෙසු රහත් සිවුනම ඇතුළු හතරදෙනෙකුගෙන් යුත් කණ්ඩායම විශේෂ පිරිසක් වූ බව පෙනේ. අප රටට වැඩි උත්තර භාරතීය ආයර්යයන් හා උත්තර භාරතීය ථෙරවාදි මහා සංඝයා අතර විශේෂ සම්බන්ධතාවක් එදත් පැවැති බවට මෙය හොඳම සාක්ෂයකි. එයට ටික කලකට පසු රජ පවුලේ ම කෙනෙකු වූ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ අවුත් භික්ෂුණී ශාසනය පිහිටවූහ.

මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිසත් සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ඇතුළු පිරිසත් මෙහි පැමිණියේ බුදු සසුන පමණක් අරගෙන නොවේ. ඒ සමග සංස්කෘතියක්, සභ්‍යත්වයක්, භාෂාවක්, ප්‍රජා පාලන සංකල්ප ආදී නිදහස් රටක ස්වාධීන් ජාතියකට අවශ්‍ය හැම අංගෝපාංගයක් ම ගෙනාහ. මේ නිසා අවුරුදු දහස් ගණනකට පෙර සිට අප ලෝකයේ විශිෂ්ට ආගමක් හා විශිෂ්ට සභ්‍යත්වයක් උරුමකර ගත් කුඩා වුවත් නිදහස් රටක වසන විශිෂ්ට ජාතියක් වීමේ භාග්‍යය ලදහ. මෙබඳු භාග්‍යයක් ලොව වෙනත් කිසිම ජාතියකට හෝ රටකට නොලැබුණි. ප්‍රාග් ඓතිහාසික යුගයේ පවා මෙරට වැසියා කිසියම් ලේඛන ක්‍රමයක් දන සිටි බව ඔප්පු වී ඇතත් අද අප භාවිත කරන අක්ෂර ශිල්පීය ඥනය අපට ලැබුණේ බුදු සමයත් සමග ය. බුදු සමයත් සමග ගෙනා ත්‍රිපිටක ධර්මය පදනම් කරගෙන අනුරාපුර මුල් අවධියේ ම සිංහල සාහිත්‍ය කලාව අපට පුරුදු විය. සෙල්ලිපි, සීගිරි ගී, සියබස්ලකර ආදිය එයට දෙස් දෙයි. පොළොන්නරු අවධිය වනවිට සිංහල සාහිත්‍යය භාරතයේ මෙන් ම පුළුල් කලාංගයක් බවට පත් වූයේ මූල බීජ ක්‍රමයෙන් වර්ධනය වී ගිය නිසයි.

බුදු දහම පදනම් කරගෙන වැඩුණු සිංහල සභ්‍යත්වයේ විශේෂ ලක්ෂණයක් වූයේ හැම දෙයක් ම බුදුදහමේ උගැන්වෙන පරිදි කුල දේවතාවන් වන හාමුදුරුවන්ගෙන් ලැබුණු උපදෙස් අනුව දශරාජ ධර්මයට හා සිවුසඟරා වතට ප්‍රමුඛස්ථානය දෙමින් දෙවනපෑතිස්, දෙටු ගැමුණු, වළගම්බා, ධාතුසේන, විජයබාහු, මහ පැරකුම්බා ආදි හැම ශ්‍රේෂ්ඨ රජකෙනෙකු ම තමන් සියල්ල දන්නා පුද්ගලයෙකු වශයෙන් නොසිතා යමක් දනසිටියත් නොදන්නා

කෙනෙකු මෙන් බුද්ධිමත් මහා සංඝයාගේත් බුද්ධිමත් ගිහි උපදේශකයන්ගේත් අනුශාසනා අවවාද නිහතමානීව අසා පිළිගෙනයි රාජ්‍ය පාලනය හෝ ආර්ථික සාමාජික ආගමික ආදි හැම කටයුත්තක් ම කළේ. දුටුගැමුණු කුමාරයා සමඟ යුද පෙරමුණේ භික්ෂූන් වැඩියේ රජුගේ දනය වැළදීමට නොවේ. ඔහුට උපදෙස් දීමටත් ඔහු හා මහජනතාව ධෛර්යවත් කිරීමටත් සිංහල ජාතියට සිංහල දේශයට වන මහ විපතින් රට ජාතිය මුදවා ගැනීමේ ඇති වැදගත් කම අන්‍යයන්ට අවබෝධ කරවීමටත් ය. එසේ නොවන්නට අද සිංහල ජාතියක් ගැන කථා කරන්නට අපට ඉතිරි වන දෙයක් නැතැයි කිව යුතු ය.

බුදු දහමින් ආභාසය ලැබූ අපේ පැරණි ආර්ථිකය තරම් ශක්තිමත් ආර්ථිකයක් අපට කවදාවත් නැවත ඇතිකර ගත හැකිදැයි කිව නොහේ. එදා හෙළයා පුරුදු වූයේ ''යථාලාභ සන්තෝෂයටයි'' එනම් ලැබුණු හැටියට කාලා ඇඳලා සැහීමකට පත්වීමයි. එවිට අසහනයක් නැත. තණ්හාවෙන් අන්ධවීමෙක් නැත. බල ලෝභයෙන් ආත්මාර්ථය තකා සෙස්සන් පෙළීමක් නැත. සාමානාත්මතාව ජන ජීවිතයේ ප්‍රධාන ලක්ෂණය විය. පාලකයාත්, ඇමතිවරයාත්, සාමාන්‍ය මිනිසාත් ජීවත් වූයේ එකම මට්ටමක ය. තම තමන් සතු විශේෂ කාර්ය හැර සෙසු පොදු කාර්යයන්හි දී සියල්ලෝ ම සමානයෝ ය. ''මඩ සෝදගත් කල ගොවියා රජකමට සුදුසු වූයේ'' ගොවිකමේ දී රජුත් ගොවියෙකු වූ නිසයි. ගොවියා පමණක් නොවේ ගොවිතැන් කළේ, පාලකයාගේ සිට හැමෝම ගොවියෝ වූහ. කෘෂික සමාජයක් වූ සිංහල සමාජයේ ප්‍රධාන ජීවන මාර්ගය වූයේ ගොවිතැනයි. වියළි කලාපය කේන්ද්‍ර කොට ගෙන

ගොවිතැන් කළ හෙළයෝ කඩිනම් අසාර්ථක වැඩ නොකළහ. වැවක් බැන්දේ සැලැස්මක් ඇතිව එයට උචිත ම ස්ථානය තෝරා ගෙනයි. කුඹුරු තැනුවේ එයට සුදුසු බිම් තෝරාගෙන ය. වාරිමාර්ග තැනුයේ සුදුසු බිම් කඩවල් ඔස්සේ ය. ඒ නිසා අවුරුදු දස දහස් ගණනක් ඉක්ම ගියත් කිසිම නඩත්තුවක් නැතුවත් අදත් ඒවා සුරැකිව තිබේ. මේ සඳහා ඔවුහු විදේශීය විශේෂඥ උපදෙස් නොසෙවූහ. විවිධ සංකල්ප මවන වත්මන් අය මේ පැරණි සංකල්ප පිළිබඳව දැන්වත් සිත් යොමු කරන්නට සිතතොත් අපේ අනාගතය සුරක්ෂිත වනු ඇත.

කලා නිර්මාණයෙහි දී ලාංකේය කලාකරුවා එද දැක්වූ දස්කම් ලොව මවිත කරවන සුලු ය. ඉසුරුමුනි පෙම් යුවළ, සඳකඩ පහණ, මහමෙවුනාවේ තොලුවිල අවුකන බුදු පිළිම, වාහල්කඩ, වාමන රූප ආදිය හෙළ කලාකරුවාගේ අදීන නිර්මාණයි. මේවා සියල්ලක්ම බුදු දහම ආශ්‍රිතව ගොඩනැඟී ඇත. ලාංකේය සිංහල සමාජ සංවිධානයේ පදනම ද බුදුදහමයි. සිගාලෝවාද සූත්‍රයට අනුව මුළු මහත් සමාජය මවුපිය දූ පුතුන්, හිතමිතුරන්, ගුරුශිෂ්‍යයන්, සේව්‍ය සේවකයන්, අඹු සැමියන්, මහණ බමුණන් යනුවෙන් එකට බැඳී ඇති සැටි බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත. ඒ අනුව රථ රෝදයක කඩ ඇණයක් මෙන් මේ ජනකොටස් එකට අත්වැල් බැඳගෙනයි සමාජ ගමන යා යුත්තේ. එම බැම්ම තහවුරු වන්නේ අන්‍යොන්‍ය යුතුකම් දෙපක්ෂයෙන් ම ඉටුවන තරමටමයි. එම යුතුකම් ද බුදුරදුන් පැහැදිලි කර දී ඇත. ඒ අනුව අවුරුදු දහස් ගණනක් තිස්සේ හැඩ ගැසුණු අපේ සමාජය ඔවුනොවුන්ට ගරුකරන ඔවුනොවුන්ගේ

දුක සැප සොයාබලන ඔවුනොවුනට පිහිට වන මවුපියන් වැඩිහිටියන් භික්ෂූන් වහන්සේ පූජ්‍යත්වයෙන් සලකන පිරිසක් බවට පත් වූහ. මේ ලක්ෂණයත් සමාජයේ යහපත් පැවැත්මට ඉවහල් විය. එසේම සදාචාර වර්ධනයට හේතු විය. දරුවන් මවුපියන් ගැන සිතුවේ බුදුන් රහතුන් ගැන සිතන්නාක් මෙනි. මාපියන් දරුවන් ගැන සිතුවේ ද තම උරුමයන් තමන්ගෙන් පසු භාරදීමට මෙන්ම භාරගැනීමට සිටින අනාගත උරුමක්කාරයන් වශයෙනි. තමනුත් රටත් ජාතියත් ආගමත් පරපුරත් යන සියල්ලක් ම ආරක්ෂා කිරීමට සිටින මහගුම වස්තුව දරුවන් බවයි, ඔවුන්ගේ හැඟීම වූයේ. එහෙයින් ඔවුහු වැඩි වැඩියෙන් මුදල් සොයන යන්ත්‍ර මෙන් සලකා මුදල් සෙවිය හැකි රැකියාවන් සඳහා ම වත්මන් මාපියන් මෙන් තම දරුවන් නොතැනුහ. ඔවුන් දරුවන් තැනීමේදී ප්‍රමුඛත්වය දුන්නේ සදාචාර ගුණවලින් පොහොසත් දරුවන් තැනීමට ය. අනතුරුවයි ජීවිත යාත්‍රාව පැදීමට අවශ්‍ය පලපුරුද්ද ඔවුනට ලබා දුන්නේ.

සදාචාර ධර්මවලින් පොහොසත් පුද්ගලයා තුළ නිතැතින් ම ජීවත්වීමේ මං පිළිබඳ අවබෝධයක් ඇති වේ. අනික එද මෙරට වැසියාට අවශ්‍ය වූයේ අනුන්ට ගැති නොවී ශ්‍රම ශක්තියෙන් දහැමින් යමක් කමක් හරි හම්බ කරගෙන ණය නැතුව ජීවත්වීමටයි. අද මෙන් සාරධර්ම සදාචාර ගුණ විනාශ කරගෙන මුදල් පදනම් කරගෙන සමාජයේ ඉහළට නැගීමට නොවේ. කාමසුඛල්ලිකානුයෝගයට හෙවත් සුඛෝපභෝගි දිවි පැවැත්මකට ඇබ්බැහි වූ පුද්ගලයා සදාචාර ධර්ම ගැන සිතන්නෙක් නොවේ. ඔහු උත්සාහ කරන්නේ කවර තරමේ හෝ අපරාධයක් කොට ධනය

සෙවීමටයි. ඔහු ඒ අනුව තමා දන්නා ශාස්ත්‍රය කාය බලය, නිල බලය, පිරිස් බලය, දේශපාලන බලය, ධන බලය ආදි හැම බලයක් ම උපයෝගි කර ගන්නේ අනුන්ගේ ධනය තමා වටා රොක්කර ගැනීමටයි. අද අපේ රටේ උද්ගත වී ඇත්තේ එබඳු තත්ත්වයකි.

''විද්‍යා දදති විනයං - විනයාද්‍යාති පාත්‍රතාම්
පාත්‍රත්වාද්ධන මාප්නෝති - ධනාත් ධර්මං තතස්සුඛං''

යන පඬිවදන අනුව එදා පුද්ගලයාගේ ශාස්ත්‍රඥනය ඔහුගේ ආධ්‍යාත්මික ගුණ වගාවට මුල්විය. උගත්කමත් හික්මීමත් ඇති පුද්ගලයා ඕනෑම කටයුත්තක් සඳහා පළපුරුදු යෝග්‍ය පුද්ගලයෙක් විය. උගත් විනය ගරුක ක්‍රියා කෞශල්‍යයෙන් සමන්විත පුද්ගලයා නිතැතින් ම ධනවතෙක් වේ. ඔහුට ජීවත්වීමේ ගැටලු ඇති නොවේ. ඔහු පලගත් අතු නසා පල කන්නවුන් මෙන් අන්‍යයන් හොඳින් හෝ නරකින් හෝ සූරාකන්නෙක් නොවේ. තම ධනය මුදල අවශ්‍ය දෙයට වැය කරන මුදලට වඩා සදාචාරය උතුම් බව සලකන මුදල, ධනය තමනට වහල්කරගත් සිංහලයා කිසිවිටක ධනයේ හෝ මුදලේ වහලෙක් නොවී ය. ''දත්වා ච භුත්වා ච යථානුභාවං - අනින්දිතො සග්ගමුපෙති ඨානං'' යන බුදුවදන අනුව තමා උපයාගත් දැහැමි ධනය උදව්වක් උපකාරයක් අවශ්‍ය තමා වටා සිටින අන්‍යයන්ට පරිත්‍යාග කිරීමෙනුත් තමාගේ ප්‍රයෝජනය සඳහා වියහියදම් කිරීමෙනුත් එයින් නිසිඵල නෙළාගත් ඔහු කීර්තිමත් නිකැළැල් සදාචාර සම්පන්න උතුම් මිනිසකු වශයෙන් තම ජීවිතය ගතකොට මරණයෙන් මතු ස්වර්ගයෙහි ඉපදීමට ධනය

උපයෝගී කර ගනී. ඔහුට මරණය ගැන සිතා බිය වන්නට හේතුවක් නොවීය. ''සුත්තප්පබුද්ධො විය එවං සග්ගෙ'' යනුවෙන් වදාළ බුදු වදන අනුව ඔහු ''නිදාගත් පුද්ගලයකු පසුදින සුවසේ පිබිදෙන්නාක් මෙන්'' තමා මරණින් මතු දෙව්ලොව හෝ මිනිස් ලොව වාසනාවන්ත පුද්ගලයකු වශයෙන් උපත ලබන බව ඔහු ම දනී. එම නිසා හොඳ බෞද්ධයාට මරණය ගැන සිතන්නට බියවන්නට කිසිම හේතුවක් නැත. ඔහු මරණයට මුහුණ දෙන්නේ සිනාමුසු මුහුණින් වීරයකු මෙනි.

ලොව අන් කිසි ම ජාතිකයකුට ආගමිකයකුට නොලැබෙන මේ උතුම් හැදියාව අපට ලැබුණේ බුදු දහමෙනි. එහෙත් අද සමාජයේ මේ ගුණ දම් යන්තමින් වත් රකින පුද්ගලයෝ අතළොස්සක් වත් සිටිත්දැයි ප්‍රශ්නයකි.

පන්සලේදි යහපත් දිවිපැවැත්මක් ගෙනයෑමට අවශ්‍ය අධ්‍යාපනයක් ලැබූ ගැමියාට සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සදුපදේශ මෙන් ම පලපුරුද්ද ද ලැබුණි. ආගම ධර්මය පමණක් නොව භාෂා ශාස්ත්‍රය ද උගත්තේ පන්සලේ හාමුදුරුවන්ගෙනි. කුල දෙවියා හෙවත් කුලය හෙවත් ජාතිය රකින්නා ය විශේෂ නාමයෙන් හඳුන්වා හාමුදුරුවන් හා උන්වහන්සේ වැඩ සිටින ආරාමය මනාව තනාදි හාමුදුරුවෝත් පන්සලත් දිවි දෙවැනි කොට ආරක්ෂා කළ පුරාණ සිංහලයා තමා ගැන හිතුවේ දෙවනුවයි. එදා සිංහලයා ආගම භාෂාමය වශයෙන් , සිරිත් විරිත් අතින්, නිජබිම වශයෙන් දේශපාලනික වශයෙන් ආදි හැම දෙයකින් ම ඒකීය ස්වරූපයක් ගෙන යදමක් සේ

එකට බැඳී සිටි නිසයි 1815 වන තුරු අවුරුදු දහස් ගණනක අදීන නිවහල් ජාතියක් වශයෙන් ලොව වැජඹෙන්නට සමත් වූයේ. එද මෙරට ආක්‍රමණශීලිව හෝ සුහදශීලිව හෝ වෙනත් ස්වරූපයකින් හෝ පැමිණි විදේශිකයන් සිංහලයා විසින් පිළිගනු ලැබුවේ ඉමහත් හරසරිනි. එහෙත් කපටි දුෂ්ට විදේශිකයෝ ඔවුන්ගේ විෂබීජ මෙරට වපුරා ආගමික වශයෙනුත් ජාතික වශයෙනුත් භාෂාමය වශයෙනුත් පමණක් නොව පළාත් ප්‍රදේශ ආදි වශයෙන් ද සිංහලයනුත් සෙසු ජාතිකයනුත් භේද භින්න කළහ. එහි අනිටු විපාක අද අප කඳුළු වගුරවමින් විඳින්නෙමු. එද අපේ අනුග්‍රහය ඇතිව අප අතර බින්න බැසගත් ඇතැම් ජාතීන් පවා සහාය කරගෙන එක්සත්ව ක්‍රියාකළ සිංහලයන් සතුරන් පලවා හැරීමට කළ සටන් පිළිබඳව වාර්තා කොතෙකුත් හමුවෙතත් අද එම ජාතීන් පමණක් නොව සිංහලයන් පවා භේද බින්න වී ආත්මාර්ථකාමීව කටයුතු කිරීම නිසා ඇතැම් විට තව වසර සියයක් හමාරක් ගතවන විට සිංහලයන්ට මේ රට අහිමි වනවා පමණක් නොව සිංහල ජාතියම මිහිපිටින් තුරන්වන ලකුණු ද දැනට පහළ වී තිබේ.

අපට අතීතයෙන් හිමි වූ ආගම, සිරිත් විරිත්, භාෂාව ආදි බොහෝ දේ අප විසින් දැනටම විනාශ කොට ඇත. ඒ නිසා අනාගත පරපුරට අපෙන් අපේ ය කියා දියහැකි දෙයක් නැති තරම් ය. ඒ තරමට අන්තයට ම පිරිහී භේද භින්න වී සිටින අප අපේ දරුවන්ටවත් අනාගතය ගොඩනගා ගැනීමට ඉඩ තැබීම ඔවුනට කළහැකි මහගු මෙහෙයකි.



# සබ්බ පාපස්ස අකරණං.....

නදී අමා ජයසේකර මහාත්මනිය
අධ්‍යාපනඥ - ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

ලාම්පු දැල්ල සුළඟට සෙලැවෙන කොට උදන ගේ සිතට දැනුණේ ලොකු බයක්.

''අපේ ජීවිතේත් හරියට පහන් දැල්ලක් වාගෙ''

දවසක් දහම් පාසලේ දී පුංචි හාමුදුරුවෝ එහෙම කිව්වා උදනට හොඳට මතක යි. ඒත් ඒ කතාවට එ ද නම් උදන ගෙ හිත ඒ තරම් කලබල වුණේ නැහැ.

උදන පැදුරේ දිගා වෙලා සිටින අම්මා දිහා ටිකක් වෙලා බලා සිටියා.

''අනේ, අම්මා ගේ ජීවිතය නම් පහන් දැල්ලක් වගේ වෙන්න එපා.''

උදන කිහිප වතාවක් එහෙම ප්‍රාර්ථනා කළා.

එද හවස පන්සලේ දී පුංචි හාමුදුරුවෝ උදන ගේ අතේ බැඳපු නූල උදන හීන් සැරේ ගැලෙව්වා.

ඒක අම්මා ගේ අතේ බැන්ද, උදන ගේ හදවතට එයින් ලැබුණේ විශාල සහනයක් ! ශක්තියක් !

එළි වෙන කල් උදාන අම්මා ළඟට වී සිටියා.

''ගණන් පොත අර ගෙන ගණන් ටිකක් හදන්න ඕනෑ.''

උදාන බංකුව උඩ වාඩි වෙලා පොත අතට ගත්තා.

ඔන්න අම්මා ආයෙමත් කහිනවා. අම්මා කහින වාරයක් පාසා උදාන ගේ බඩ පපුව පත්තු වෙලා යනවා.

බැරි ම තැන උදාන ගණිතය පොත බංකුව උඩ තියලා නැඟිට්ටා.

මල්ලිලා දෙන්නා යි, නංගි යි, තව ම නිදි.

''පුතේ උඹ කඩේට ගිහිල්ලා මුදලාලි ගෙන් ඊයේ ඉතුරු වෙච්ච පරණ පාන් ගෙඩියක් වත් ඉල්ලා ගෙන වරෙන්කෝ. මේ පොඩි ඇයොන්ට ඔය හැටි බඩගින්න උහුලන්න පුළුවනෑ?''

උදාන මොහොතක් කල්පනා කළා. ඊයේ උදේ කඩේ දී සිදු වූ දේ අම්මා දන්නවා නම්?

මුදලාලි ගෙන් පාන් බාගයක් ඉල්ලූ හැටි..... හාමිනේ බැණ වැදුණු හැටි...

''බොලා ගේ අප්පොච්චි වළ පල්ලට ගියා කියලා අපි පලි ද බං? හැම ද මත් මේක කරන්න පුළුවන් ද? දැන් සති දෙකක් තිස්සේ ණයට කනවා.''

★ ★ ★

අම්මා කුලී වැඩ කරන දවස්වල නම් උදාන ඉස්කෝලේත් ගියා. ඒත් අම්මා ලෙඩ පැදුරට වැටුණු දා ඉඳලා උදානට ගෙදර නවතින්න සිදු වුණේ මල්ලිලාට යි, නංගිට යි, කන්න වත් මොනවා හරි හොයා ගන්න ඕනෙ නිසා.

උදන ආයෙමත් ගණන් පොත දිහා බැලුවා.

''ගණිතය - දෙ වන ශ්‍රේණිය''

අකුරු නිමේෂයකින් බොඳ වෙලා නො පෙනී ගියා.

''පලයං දරුවෝ, ඊයේත් බඩගින්නේ නේ හිටියේ?''

ඇත යාන්තමට ඉර පායා ගෙන එනවා. උදන මිදුලට බැස්සා. සරත් මාමා පාන් බයිසිකලයත් පැද ගෙන ඉස්සරහට එනවා. බයිසිකලය නැවතුණා.

පාන් සුවඳ දැනෙන කොට උදන ගේ කුසගින්න ආයෙමත් අවදි වුණා.

''උදන, මෙන්න මේක ගනිං. මං මුදලාලිට කියන්නම් පාන් ගෙඩියක් අඩුවෙනු යි දීලා තියෙන්නේ කියලා. ඕක අම්මාටත් දීලා කාපල්ලා.''

උදන බලා හිටියා. ඒත් උදන ගේ අත පාන් ගෙඩිය ගන්න දිගු වුණේ නැහැ. දහම් පාසලේ පුංචි හාමුදුරුවන් ගේ හඬ උදන ගේ කන ළඟින් ම ඇහෙන්න පටන් ගත්තා.

''සොරකම් කිරීමත්, සොරකමට අනුබල දීමත් මහා පාපයක්.. නංගිලා මල්ලිලා දන්නවා ද බොරු කීමත්, බොරු කීමට අනුබල දීමත්, ඒ වාගේ ම තවත් පාපයක්.. තමන් ගේ ජීවිතය පරදුවට තබා පන්සිල් රකින අය මේ සමාජයේ ඉන්නවා... නංගිලා මල්ලිලාත් එහෙම වෙන්න ඕනෑ.. ඒ වාගේ පින්වන්ත අයට කරදයක් වෙන්න යන කොට දෙවියොත් පිහිට වෙනවා....''

උදන කටහඬ අවදි කළා.

''සරත් මාමේ, අපි නිසා සරත් මාමා හොරකම් කරන්නත්, බොරු කියන්නත් එපා.

අපි පන්සිල් රකිමු. එතකොට අපේ අම්මාට ඉක්මනට සනීප වෙයි කියලා මට හිතෙනවා.''

උදන සරත් මාමාට වැඳලා පාරේ ඉස්සරහට ගියා.

''පුදුම කොල්ලෙක්. බඩගින්නේ මැරුණත් පන්සිල් රකිනවා !''

සරත් මාමා ආපසු පාන් ගෙඩිය පෙට්ටියට ද ගත්තා. බයිසිකලය පැද ගෙන යන්න ගියා.

★ ★ ★

උදන සිරිසේන මාමලා ගේ වැට අද්දර නැවතිලා කොස් ගහ දිහා බැලුවා.

ගහේ කඳ වැහෙන්න මහ විසාල කොස් පොකුරු රොත්ත යි. ඒ වුණාට කව ද වත් කාට වත් ගෙඩියක් දෙන්නේ නම් නැහැ.

''මොකෝ ළමයෝ බලා ඉන්නේ? අද සිරිසේනලා ගෙදර නැහැ. වන්දනාවේ ගියා නේ? උඹට ඕනේ නම් කඩුල්ලෙන් පැනලා ඇවිත් කොස් ගෙඩියක් කඩා ගනිං. ගහ යට වැටිලා නිකං අහක යන එක නේ?''

අල්ලපු වත්තේ සුදු ආතා එහෙම කිව්වා.

''ඒ වුණාට සුදු ආතේ අනුන් ගේ දේ අහන්නේ නැති ව ගත්තා ම ඒක හොර කමක් නේ?''

සුදු ආතාත් ඔළුව වැනුවා.

''අම්මපා උඹ හිතන හැටි!''

උදන හිමින් හිමින් ගිහිල්ලා බයෙන් බයෙන් කඩේට ගොඩ වුණා.

මුදලාලි ඉස්තෝප්පුවේ බුලත් විට් හදනවා.

''හාමිනේ, මෙන්න උදන කොලුවා ඇවිල්ලා.''

උදන පරෙස්සමට මුදලාලි දිහා බැලුවා. ආයෙමත් හැරිලා කඩේ ඇතුළට එබුණා.

''මොකක් හරි අමුත්තක් තියෙනවා.'' උදනට හිතුණා.

හාමිනේ ඇඳ ගෙන සිටි චීත්තයේ අත් දෙක පිස දමමින් ඉස්තෝප්පුවට ආවා.

''උඹ ගැන තමයි මං මෙච්චර වෙලා මුදලාලිත් එක්ක කතා කර කර හිටියේ. උඹ සරත් පාන් ගෙඩියක් දුන්නා ම එපා කිව්වා ලු නේ ද? ඒක හොර කමක් කියලා..

මං ඊයේ බැන්නා තමයි. ඒත් උඹලා වාගේ දරුවන්ට ඉතින් බෑ කියන්නේ කොහොම ද?

හාමිනේ පාන් අඩුක් කරලා තිබුණු වීදුරු පෙට්ටිය ඇරියා.

''හොඳ ගතිගුණ තියෙන ළමයින් ළඟ දෙවියොත් ගැවසෙනවා කියලා කියනවා නේ හාමිනේ?''

''හැබෑ නේන්නම්.... අම්මාට සනීප වෙන කල් උඹ මෙහේ අවිල්ලා පාන් ගෙඩියක් දෙකක් අර ගෙන පලයං.''

හාමිනේ පාන් ගෙඩි දෙකක් ඔතලා උදන ගේ අතට දුන්නා. උදන පුදුම වෙලා බලා හිටියා.

''මං දිනපතා ඇවිත් කඩේ අස් කරලා අතු ගාලා දෙන්නම්.''

උදනට කියැවුණා.

මුදලාලි කටේ තිබුණු බුලත් හපය මිදුලට වීසි කරලා හයියෙන් හිනා වුණා.

''උඹ තාම කිරි සප්පයෙක් නේ බං? උඹට පුළුවන් ද කඩවල වැඩ කොරන්න? අම්මාට සනීප වුණා ම එන්නේ නැතෑ?

හැබැයි ඉස්කෝලේ නො ගිහින් නම් අහු වෙනවා නෙවෙයි ඔන්න.''

හාමිනේත් මුදලාලිට එකතු වුණා.

''උඹලා තමයි ලොකු මහත්තුරු වෙන්න ඕනෑ.. ගුණධර්ම තියෙන අය! ''

උදන මුදලාලිට යි, හාමිනේට යි, වැඳලා ගෙදර යන්න ඉගිල්ලුණේ කුරුල්ලකු වාගේ.

ඒත්.....

මෙන්න පුංචි හාමුදුරුවෝ පිණ්ඩපාතේ වඩිනවා!

උදන ආයෙමත් කඩේට දිව්වා. ඇහිල්ලක් බැලිල්ලක් නැති ව ම පාන් ලෑල්ල යි, පිහිය යි, අතට ගත්තා. ලොකු ම ලොකු පාන් පෙත්තක් කපලා පුංචි හාමුදුරුවන් ගේ පාත්තරයේ තැන්පත් කරලා දණ ගහලා වැන්ද.



ගුණ මිණි ආර - 13

# කුමරතුඟු පැතුම: සිරිමත් දරු පෙළකි

**(කුමරතුංග මුනිදස මහ පඬිවරයාණන් ගේ වියොවින් 70 වසරක් ගෙවීම නිමිත්තෙනි)**

“ගුරු සීයා” විසිනි

මේ හෙළ දෙසේ හෙවත් ශ්‍රී ලංකාවේ හෙළ බස - හෙළ රැස - හෙළ දෙස යනුවෙන් තෙරුවනක් සකසා එ ම තෙරුවනේ දියුණුව උදෙසා අනුපම වූ අමිල වූ මහ මෙහෙවරක් සිදු කළ මහ පඬිවරයාණෝ නම් කුමාරතුංග මුනිදසයෝ ම ය.

වත්මන්හි දු කුමාරතුංගයන් කියැවීම හෙවත් ඔවුන් මෙ දැයට දයාද කළ උතුම් ගත් රුවන් හැදෑරීම තරම් වටනා දැයක් බස-රැස-දෙස තෙරුවනේ ඔසොවුව සඳහා වෙනත් ඇතැයි අපි නො අදහමු. කුමරතුඟු පත පොත එ තරම් මහ මෙහෙවරක් මෙ බසට මෙ දැයට මෙ දෙසට සිදු කෙළේ මැ යි.

වත්මන්හි අධ්‍යාපනයෙහි ලා ‘චරිතායන අධ්‍යාපනයක්’ ගැන කතා කැරෙයි. එනම් දරුවාගේ බුද්ධිය පමණක් නො ව යහපත් හැසිරීම ද හැඩගස්වන අධ්‍යාපන ක්‍රමවේදයකි. කුමරතුඟුන් ළමයින් සඳහා පබඳ කළ සියලු ම රචනාවල පාහේ මේ ලක්ෂණය අපට දැකිය හැකි ය. ඔවුන් තරම් ළමා මනස හඳුනාගත්, ළමයින් සඳහා කමනීය නිවැරදි බස්

වහරක් යොදා ගනිමින් ළමා රචනා කළ විශිෂ්ට ගණයේ ළමා ප්‍රබන්ධ කරුවෙක් වර්තමානයෙහි තබා අනාගතයෙහි දු පහළ වේ දෝ යන්න සැක සහිත ය.

ආචාර්ය තිලෝකසුන්දරී කාරියවසම් අධ්‍යාපන මනෝ විද්‍යා විශේෂඥවරිය වරෙක මෙ ලෙස සඳහන් කළා යː

''කුමාරතුංග මුනිදාසයන් ගේ ප්‍රතිභා ශක්තියේ මහිමය සැබැවින් ම අපට වැටහෙන්නේ ඔවුන් ගේ ළමා සාහිත්‍ය නිර්මාණ විභාග කිරීමේ දී ය.''

'' ඔවුන් තරම් ගැඹුරින් ළමා මනස හඳුනාගත් වෙනත් කිසිදු සිංහල ලේඛකයෙක් ද නැත. ඔවුන් ඒ ඒ වයසට අදාළ ළමා මනසෙහි සිතුම් ව්‍යුහයන් හඳුනාගෙන ඇති අන්දම පුදුම සහගත ය. විද්‍යාඥයන් ළමා මනස ගැන හෙළි කරගැනීමට සමත් වී ඇති කරුණු සියල්ලක් ම කුමාරතුංගයන් සිය තියුණු නිර්මාණාත්මක බුද්ධියෙන් ග්‍රහණය කරගෙන සිටි බව එතුමන් ගේ ළමා සාහිත්‍ය නිර්මාණවලින් හෙළි වේ. මේ වූ කලි ඔවුන් ගේ සුභග භාවය ප්‍රකට කරවන බලවත් සාධකයකි. මනෝ විද්‍යාඥයන් එ වැනි හැකියා හඳුන්වන්නේ සහජ ඥනය (Intuition) වශයෙන් ය.''

කුමාරතුංග පඬිතුමා විසින් පබඳ කරන ලද ඉතා ප්‍රකට ''සිරිමත්'' පැදි පෙළ පමණක් ම ගෙන බැලුව ද ඉහතින් කියූ, ඔවුන් සතු ව පැවැතුණු අපූරු හැකියාව හොඳින් තේරුම් ගත හැකි ය.

ඉතා යහපත් සුභග දරුවකු නිර්මාණ කැර ගැනීමෙහි ලා 'සිරිමත්' කවි පෙළ දෙන මහනීය අනුබලය වචනයෙන් කිව නොහැකි තරම් ය. අට මත් විරිතින් පබඳින ලද කවි

11 ක් පමණ වන මේ පැදි පෙළ කුමාරතුංගයන් පළ කළ ''ශික්ෂා මාර්ගය'' පළමු වන පොතෙහි ඇතුළත් ය.

කවි පෙළ ඇරඹෙන්නේ පහත සඳහන් පැදියෙනි.

සිරිමත් මගෙ සකි
යහපත් ළමයෙකි
නුවණත් ඇත්තෙකි
වැඩටත් සමතෙකි

සිරිමත් නම් වූ මේ දරුවා, නමට ම ගැළැපෙන ලෙස යහපත් ගති ගුණ ඇති, බුද්ධිය නුවණ ඇති, එ මෙන් ම කාර්යශූර කෙනකු බව එයින් කියැවේ. හිස - හද - අත පිරිපුන් බවට පත් කරන අධ්‍යාපන විද්‍යාවක් ගැන කථා කරන වත්මන් යුගයෙහි කුමරතුඟුන් ඉසිවර දැසින් මෙන් එය පෙන්නුම් කැර ඇති අයුරු සැබැවින් ම විස්මයජනක ය.

''සිරිමත්'' පැදි පෙළ යනු සැබැවින් ම යහපත් දරුවකු ගේ දින චර්යාව හැඳින්වීමක් වෙයි. උදේ නැඟිටීමේ සිට රෑ නින්දට යෑම තෙක් දරුවකු ගේ චර්යාමය අභ්‍යාස ළමයිනට අනුපිළිවෙළින් උගන්වන අයුරු හොඳින් විමසා බලන්න.

උදය ම පුබුදී
මුහුණට දිය දී
කුල දෙවි නමදී
ගේ දෙර හමදී

පාඩම් කරනට
පත පොත ගෙන සිට
සිත වෙන දෙයකට
නො හරී කිසි විට

කුඩා කල කෑම බීමේ පටන් මහතකු ගේ (මහාත්මයකු ගේ) සිරි ගන්වන අයුරු කොතරම් දූරදර්ශී ද? වත්මන්හි දෙමවුපියන් දරුවනට මහතුන් සේ කෑම ගන්නට හුරු කරවන අවස්ථා විරල ය. දෙමවුපියන් ගෙන් ද ඊට ආදර්ශයක් නැති තරම් ය. බලන්න සිරිමත් කෑම අනුභව කරන අයුරුඃ

වෙලාව නො වැරැද
කෑමට ආ සඳ
ඔහුට වඩා සොඳ
මහතෙක් කවරෙ ද?

සිරිමත් පාසල් යන විලාසය සෙසු ළමයිනට ද ප්‍රබෝධයක් ඇති කරවන්නකි. එය පෙන්වන විචිත්‍රාකාරය බලන්න.

පාසල් යන්නේ
දෙව් ලොව මෙන්නේ
දක දරුවන්නේ
මුහුණු පිපෙන්නේ

''දෙව් ලොව මෙන්නේ'' ''මුහුණු පිපෙන්නේ'' යන යෙදුම්වලින් සිරිමත් සහ යාළුවන් (සෙසු දරුවන්) කිසිදු අලස කමක් නැති ව ප්‍රබෝධවත් අයුරින් පාසල් යන අයුරු මැනැවින් චිත්‍රණය කැර ඇත.

එහි කියැවීමට
ලියුමට ගැණුමට
කව් ගී කීමට
දෙ වැනි ද කා හට

දක්ෂ දරුවකු විවිධ ක්ෂෙත්‍රයන්හි දක්වන සමත් කම් එයින් නිරූපණය කැරේ.

දරුවකුට යහපත් වූ අධ්‍යාපනයක් මෙන් ම නීරෝගී වූ කයක් ද නිර්මාණය කර දීම වැඩිහිටියන් ගේ යුතුකම වෙයි. නීරෝගී කයක් මෙන් ම නීරෝගී මනසක් සඳහා ද දරුවාට ක්‍රීඩාව අත්‍යවශ්‍ය සාධකයක් වෙයි.

සෙල්ලම් පළෙහි ද
සිරිමතු දුටු සඳ
එනු එනු යැ යි සෙද
නොකියන්නේ කො ද

සිරිමත් සෙල්ලම් පිට්ටනියෙහි ද ආකර්ෂණීය චරිතයක් බව එයින් කියැවේ. වැඩිහිටියනට ගරු කරන දරුවා දියුණුවට පත් වන බව බුදුරජාණන් වහන්සේ ද වදාළහ. සිරිමත් ද එ බඳු දරුවකු බව පහත සඳහන් පැදියෙන් පැහැදිලි වේ.

වැඩිහිටියන් හට
දන්වා නිසි කොට
කටයුතු කරනට
කැමැති ය හැම විට

පෙරදිග බුදුනු සිරිත් අනුගමනය කරන හොඳ දරුවෝ තෙරුවන් නැමැඳ දෙමවුපියන් ද වඳිති. එ මෙන් ම පසු දිනට යෙදී තිබෙන වැඩ ද නුවණින් සිහි කැර ගැනීම නිසි කළමනාකරණයට මඟ වෙයි.

නින්දට යන තැන
කුල දෙවි වඳිමින
කටයුතු පසු දින
සලකයි නුවණින

යනුවෙන් කීයේ එ කරුණ යි.

ඉතා උතුම් දරුවකු හදගැනීමට ඒ දරුවා තුළ යහපත් චින්තනයකට මඟ එළි පෙහෙළි කැරදීම අත්‍යවශ්‍ය වෙයි. චින්තනමය දියුණුවක්, සිතීමේ හැකියාවක් නැති පුද්ගලයා කිසිදු දියුණුවකට පත් නොවන බව බුදුරජාණන් වහන්සේ ද මෙසේ වදාළහ. **''නාචින්තයන්තෝ පුරිසෝ - විසේස'මධිගච්ඡති.''**

මේ කුඩා සිරිමත් දරුවා ගේ වෙනස බලන්න. හොඳ දේ සිතීම, එය කීම, ඒ කී දේ කිරීම සිරිමත් ගේ ගති ලක්ෂණ වෙයි. එය ඉතා කෙටි පැදියකින් පළ කැර ඇති අපූරුව සලකන්න.

සොඳ දේ සිතුමත්
සිතූ දේ කීමත්
කී දේ කැරුමත්
නො හරී සිරිමත්

පැදි පෙළ අවසන් කැරෙන්නේ මෙ ලෙස හැදෙන, හැසිරෙන සිරිමත් මවුපියනට නෑ-දෑයනට පමණක් නො ව, හැම දෙනාට ම හෙවත් මුළු දෑයට ම සැපතක් වන බව යි.

මවු පිය සහ ගුරු
නෑ දෑ සොහොවුරු
සැමට ම කීකරු
සැපතෙකි මේ දරු

දරුවකු ගේ දිනචර්යාව තුළ පිරිපුන් මිනිසකු තැනීමේ පදනම මෙම පැදි පෙළෙන් කෙතරම් අගනා ලෙස සකසා ඇද්ද යන්න නුවණින් විමසන විට වැටහී යනු ඇත. මෙහි 'සිරිමත්' යන ආමන්ත්‍රණය තුළ ගැහැනු දරුවන් ද (සිරිමතීලා ද) ඇතුළත් වන බව සිතිය යුතු යි. දරුවකු ගේ

ළමා විය පෝෂණය කිරීමට සමත් වන මෙ බඳු පැදි පෙළක් ලෝක සාහිත්‍යයෙන් වත් සොයාගත හැකි වේ ද යන්න සැක සහිත ය. අධ්‍යාපනයේ පරමාර්ථ සලකන, දූයේ මල් සම්පත රැක ගැන්මට වැර දරන, දරුවන් ගේ දිවි මග නිසි ලෙස හැඩ ගස්වන්නට සැලැසුම් සොයන සියලු බුද්ධිමත් වැඩිහිටි වගකිව යුත්තන් ඉහත සඳහන් සිරිමත් පැදි පෙළ එද සමාජයටත් වඩා අද සමාජයේ දරුවනට ආදරයෙන් අවධාරණය කරවන්නට උත්සුක විය යුතු ය.

''බුදු රදුන්ගේ ධර්මයෙහි පරිපූර්ණ සදාචාර ධර්ම පද්ධතියක් සහ උසස් මනෝ විද්‍යාවක් හා වෙළී පවත්නා ලෝකෝත්තර අධ්‍යාත්ම විද්‍යාවක් ගැබ්ව පවතිනු දැකිය හැකි ය. සරල සිත් ඇත්තහුට එය සාධුශීල සංහිතාවකුත් ඉදිරිපත් කරයි. උනන්දුමත් විද්‍යාර්ථියාට පවිත්‍ර චින්තා පද්ධතියකුත් ඉදිරිපත් කරයි. එහෙත් මූලික වන්නේ ආත්ම පාරිශුද්ධියයි. පවිත්‍රත්වයෙන් හා කරුණාවෙන් යුත් ජීවිතයක් ගත නොකරන්නාට ආධ්‍යාත්මික ප්‍රගතිය ලබා ගත නොහැකි ය.''

**ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා**
ධර්මපාල ප්‍රතිරාවය - 5 වන පිටුව